# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2186/31 - 2020 ජූලි මස 31 වැනි සිකුරාදා - 2020.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ**
**28 වන වගන්තිය යටතේ වූ නියමය**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 28 වන වගන්තිය යටතේ අධ්‍යාපන, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියමය

**ඩලස් අලහප්පෙරුම (පා. ම.),**
අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය.

2020 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියමය

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 28 වන වගන්තිය යටතේ සාදන ලදුව, 2016 ඔක්තෝබර් මස 27 වන දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ II උපලේඛනයේ අගට පහත දැක්වෙන නව ක්‍රීඩාව/ක්‍රීඩා පන්තිය ඇතුළත් කිරීමෙන් ඒ නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

72. ජිට් කුන් ඩෝ

08-310


1A - G 32596 – 22 (2020/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

32 සහ 33 වන වගන්තිය යටතේ නියෝග

අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව පාපැදි ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී සම්මේලනයේ කටයුතු තව දුරටත් පවත්වාගෙන යාම සඳහා සහ නිලවරණය කැඳවීම හා පැවැත්වීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මෙයින් බලය පවරමි.

**ඩලස් අලහප්පෙරුම (පා. ම.),**
අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය.

2020 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

08-311

---

## 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

**ඩලස් අලහප්පෙරුම (පා. ම.),**
අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය.

2020 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 පෙබරවාරි මස 13 වැනි දින අංක 2006/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග, 2019 අගෝස්තු මස 23 දින අංක 2137/85 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග, 2020 මාර්තු මස 10 වැනි දින අංක 2166/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග සහ 2020 මැයි 27 වැනි දින අංක 2177/8 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග මගින් සංශෝධිත 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල II වන කොටසේ දැක්වෙන 5(1) හි පළමු ඡේදය පහත සඳහන් පරිදි නව වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරමි :

5(1) සෑම ජාතික ක්‍රීඩා සංගමයක්ම පහත දැක්වෙන නිලධරයන් ද ඇතුළුව තම ව්‍යවස්ථාවේ දක්වා ඇති නිලධරයන් සංඛ්‍යාවන්ගෙන් සමන්විත කමිටුවක් තෝරා පත්කර ගත යුතුය. එම විධායක කමිටුව සඳහා පත්වන සාමාජිකයින්ගෙන් අවම වශයෙන් සියයට විස්සක ප්‍රතිශතයක (20%) කාන්තා නියෝජනයක් ද 20%ක තරුණ නියෝජනයක්ද තිබිය යුතුය. (මෙහි තරුණ නියෝජනය යනු වයස අවුරුදු 18ට වැඩි 40ට අඩු පුද්ගලයින් වේ.)

මෙම නියෝගය 2021.01.01 දින සිට වලංගු වේ.

08-317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.